# තිලකා අලුත් වැඩක
# හදේ වීණා




හදේ වීණා එළි දැක්වීම අප්‍රේල් 3 වන දා සවස 4ට ලේලෝ හි බැරී කොමියුනිටි ශාලාවේදී

## මුහුණට මුහුණ

ශ්‍රීනාත් මද්දුමගේ

තිලකා රූපසිංහ නම් ගායිකාව මෙලබන් පුරවරයේ සිටින සෑම කෙනෙක්ම හොඳින් හඳුනනවා. මෙල්බන් පුරවරයේ සිටින ගායක ගායිකාවන් අතරින් කැපී පෙනෙන ගායිකාවක් ලෙස අපට ඇය හඳුන්වන් පුලුවන්. පැරණි ගීත සහ හින්දි ගීත වලට ඇලුම් කරන තිලකා ගේ විශේෂත්වය වන්නේ දේශාභිමානී ගීත වලටත් ඇය දක්වන ලැදියාවයි. ඕනෑම උත්සවයක ඇයට මූලිකව ගීත ගායනා කරන්නට ආරාධනා ලැබෙන්නේ මේ දේශාභිමානී ගීත වලට ඇති ඇගේ කැමැත්ත හා දක්ෂතාව නිසයි.

හදේ වීණා නමැති සංගත තැටියත් සමග මෙවර තිලකා අප හමුවට එන්නේ මෙල්බන් පුරවරයේ සිටින සංගීත ලෝලීන්ට අමතක නොවන ගීත කීපයක් තිලිණ කරමිනුයි. මෙහි විශේෂත්වය වන්නේ අප වසර ගණනාවක් තිස්සේ නිතර අසන ඇලුම්කරන හින්දි ගී තනු අනුව ගැයෙන සිංහල ගීත කීපයක් අපට අසන්නට ලැබීමයි. මේ සංගත තැටිය එළිදැක්වීමේ උත්සවය නිමිතිකොට ගෙන සන්නස තිලකා සමග පිළිසඳරක යෙදුණා.

*ශ්‍රීනාත්*
ඔබේ සංගීත දිවිය ඇරඹුන තැනින් පටන් ගනිමුද?

*තිලකා*
පාසල් කාලයේ පටන් මට ගීත ගායනා කිරීමේ යම්කිසි හැකියාවක් තිබුණා. පාසලේදී හා එයින් බැහැරව මම නිතර ගීත ගායනා කළා. නමුත් වෘත්තිය ගායිකාවක් වන්නට මගේ බලාපොරොත්තුවක් තිබුණේ නැහැ. නමුත් ගීත ගායනා කිරීමේ ආසාව මගේ සිතේ හැමදාමත් තිබුණා. මා මිලින්ම ප්‍රසිද්ධ වේදිකාවක ගී ගායනා කළේ 1988 මෙල්බන් පුරවරයේ පැවති ඉන්ද්‍රාණි පෙරේරා මහත්මියගේ සංගීත රාත්‍රියකදී සහය ගායිකාවක් ලෙසයි. මේ අවස්තාව මට ලබා දුන්නේ දයා සිල්වා මහතායි. ඉන්පසුව මම ඩින්කම් ලංකා සහ සිල්වර්ලයින් කියන සංගීත කණ්ඩායම් වලට එකතු වෙලා ගීත ගායනා කළා. ඉන්පස්සෙ බොහෝ සංදර්ශණ වලදී මා ගීත ගායනා කළා.

*ශ්‍රීනාත්*
හදේ වීණා ඔබේ කීවෙනි සංගත තැටියද?

*තිලකා*
මේ මගේ තුන්වන ගීත එකතුවයි. මුළින්ම මම 1994 දී පුරා හදේින් නමින් කැසට් පටයක් එළිදැක්වුවා. ඉන්පස්සෙ 2005 ආරාධනා නමින් සංගත තැටියක් එළිදැක්වුවා. අවුරුදු 6 කට පස්සෙ 2011 මේ සංගත තැටිය ඉදිරිපත් කරනවා.

*ශ්‍රීනාත්*
ඇයි ඔබ මෙවැනි පැරණි හින්දි තනු වලට අනුව ගී ගයන්න තීරණය කළේ?

*තිලකා*
මේක අහම්බෙන් සිදුවුණ දෙයක්. මට ස්වාධීන රූපවාහිනියේ චැට් ඇන්ඩ් සික් වැඩසටහනේ ගීත ගායනා කරන්නට ආරාධනා ලැබුණා. මම මෙහි ගීත ගායනා කරන විට එහි සංගීත අධ්‍යක්ෂණය කරන මනෝජ් පීරිස් මහතා මගේ ගායනා විලාශයට ප්‍රශංසා කළා. ඉන්පසුව ඔහුගේ අදහසක් අනුව තමයි මේ සංගත තැටිය නිර්මාණය වෙන්නෙ.

*ශ්‍රීනාත්*
මේ නිර්මාණ වල පසුබිම කොහොමද?

*තිලකා*
මේ සංගත තැටිය නිර්මාණය කළේ මම මුලින් කිව්වා වගේ පැරණි හින්දි තනු ඇසුරිනුයි. මෙම සංගත තැටියට ගීත 12 ක් අයත්වෙනවා. මේ හැම ගීතයක්ම රචනා කළේ ප්‍රසිද්ධ ගීතරචකයකු වන මහින්ද දළුගොඩ ආරච්චි මහතායි. නව සංගීත සංයෝජනය කළේ මනෝජ් පීරිස්. මේ කටයුත්තෙදි මේ අ යමට හුගාක් උදව් උපකාර කළා. මෙතරම් සාර්ථක වැඩක් කරගන්නට හැකි වුණේ මේ අය නිසයි. ඒ එක්කම හැමදාම මගේ සෙවණැල්ල වගේ පිටුපසින් සිටින මගේ සැමියා වන නිමල් රූපසිංහවත් මතක් කළ යුතුයි. මගේ දියණියන් දෙදෙනාගේ දිරිගැන්වීමත් මට විශාල රුකුලක්.

*ශ්‍රීනාත්*
පැරණි හින්දි තනු වලටම මේ නිර්මාණ කරන්න විශේෂ හේතුවක් තිබුණද?

*තිලකා*
ඔව්. විශේෂ හේතුවක් තිබුණා. පළමු කාරනාව තමයි මම හින්දි ගීත වලට දක්වන ලැදියාව. දෙවැනි කාරණය තමයි අද බිහිවන හුගාක් ගායක ගායිකාවන්ගේ ගීත වල ඇති ඒකාකාරී බව. මොන තරම් හොඳට ගායනා කළත් ඒ ගීත අපේ හදවත් තුළ රැඳෙන්නෙ නෑ. නමුත් පැරණි ගායක ගායිකාවන් ගායනා කළ ගීත හා හින්දි ගීත වසර ගණනාවක් ගියත් අපේ හදවත් තුළ රැඳී පවතිනවා. ඒ නිසයි මම කල්පනා කළේ නව පරපුරට මේ ගී තනු ඇසීමට අවස්ථාවක් ලබා දීමටත් හින්දි ගීත වලට ආදරය කරන අන් අයට ඒවා නැවත රසවිඳීමට අවස්ථාවක් ලබා දීමටත්.

*ශ්‍රීනාත්*
මෙය ලංකාවේදී එළිදැක්වීමෙන් පසු ඔබට ලැබුණ ප්‍රතිචාර කොහොමද?

*තිලකා*
කියන්න සතුටුයි මම බලාපොරොත්තුවුනාට වඩා හොඳ ප්‍රතිචාර මට ලැබුණා. විශේෂයෙන්ම පුවත්පත් හා රූපවාහිනී ආයතන මට විශාල අනුග්‍රහයක් ලබා දුන්නා. ඒ එක්කම මේ වන විට ලංකාවේ ගුවන් විදුලි නාලිකා වල මේ ගීත ප්‍රචාරය වෙනවා. ඉතින් මේ සියල්ල ගැන මං ඉතාම සතුටු වෙනවා. ඒ නිසා මේ සතුට මා සමග ජීවත් වන සියලු දෙනා සමගම බෙදා ගන්නට මම බලාපොරොත්තු වෙනවා. මේ එළිදැක්වීම අප්‍රේල් 3 වන දා සවස 4ට බැරී කොමියුනිටි ශාලාවේදී පවත්වනා.

ඒ එක්කම මගේ සංගීත දිවියට උදව් කළ නම් වශයෙන් කියන්නට බැරි සැම දෙනාටමත් ස්තුතිවන්ත වෙනවා.

හදේ වීණා සංගත තැටිය ඔබට අසන්නනට පෙර අපට අසන්නට ලැබුනා. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම අලුත් වැඩක් කර ඇති තිලකා ගීත තෝරා ගැනීමේ දී හා ගායනයේදී මනා හැකියාවක් පෙන්වා තිබෙනවා. ඒ සමගම සහය ගායනයෙන් ඉෂාක් බෙග් ගේ දායකත්වයද කැපී පෙනෙනවා. මේ අපූරු සංගත තැටියේ ගීත ඇසීමටත් තිලකා ගේ සංගීත ගමනට දිරි දීමටත් ඇගේ ගී අගය කරන සියල්ලන්ටම අප්‍රේල් 3 වන දා බැරිරෝඩ් කොමියුනිටි ශාලාවට එන්නැයි අපි ඉල්ලා සිටිනවා.

**ගෙයක් සහ ඉඩම විකිණීමට**
නුවර - කටුගස්තොට

කටුගස්තොට දුම්රියපොළ ආසන්නයේ පර්චස් 15ක ඉඩමේ පිහිටි ජලය සහ විදුලිය පහසුකම් ඇති කාමර 3 ක අගනා නිවස සහ අංග සම්පූර්ණ ඇනෙක්සිය විකිණීමට ඇත. බලාපොරොත්තු වන මුදල රුපියල් ලක්ෂ 78 කි

විමසන්න - රන්ජන 94 77 355 2610
ranjanawijesinghe@ymail.com